# තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# පුරප්පාඩු

**ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සහ විශාලතම ක්‍රීඩා සංකීර්ණ පද්ධතිය කළමනාකරණය කරනු ලබන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය සතු මානව සහ භෞතික සම්පත් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස මෙහෙයවීම සඳහා, ඉහළ නායකත්ව හා හැකියාවන්ගෙන් පිරිපුන්, පළපුරුදු සහ දක්ෂ වෘත්තිකයින්ගෙන් පහත සඳහන් සහකාර අධ්‍යක්ෂ සහ ක්‍රීඩාංගන කළමනාකරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

## සහකාර අධ්‍යක්ෂ (පාලන) (MM 1-3) පුරප්පාඩු - 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් රාජ්‍ය පරිපාලනය/ වානිජ/කළමනාකරණය / නීතිය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ වෙනත් උපාධියක් සමඟ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගෙන තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

01. "කනිෂ්ඨ කළමනාකාර" JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක සේවා ගණයේ I වන ශ්‍රේණියෙහි වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය** : (2025-03-25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)
MM 1-3 – 2025 (96,650 – 10 X 2,480 – 15 X 3,450 – 173,200)

**වයස් සීමාව** : අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) (MM 1-3) පුරප්පාඩු - 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් / විදුලි / කාර්මික ඉංජිනේරු උපාධියක් සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ පළපුරුදු සිවිල් ඉංජිනේරුවරයෙකු වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

01. "කනිෂ්ඨ කළමනාකාර" JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක සේවා ගණයේ I වන ශ්‍රේණියෙහි වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය** : (2025-03-25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)
MM 1-3 – 2025 (96,650 – 10 X 2,480 – 15 X 3,450 – 173,200)

**වයස් සීමාව** : අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) (MM 1-3) පුරප්පාඩු - 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගිණුම්කරණය ඇතුළත් වානිජ්‍යවේදී මූලික උපාධිය හෝ CIMA (UK) අවසන් අදියර සමත්ව තිබීම හෝ ACCA (UK) අවසන් අදියර සමත්ව තිබීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ අවසන් අදියරය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

01. අදාළ තනතුරට පැවරෙන විෂය ක්ෂේත්‍රයට අදාළ "කනිෂ්ඨ කළමනාකාර" JM සේවා ගණයෙහි I වන ශ්‍රේණියේ වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය** : (2025-03-25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)
MM 1-3 – 2025 (96,650 – 10 X 2,480 – 15 X 3,450 – 173,200)

**වයස් සීමාව** : අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## ක්‍රීඩාංගන කළමනාකරු (JM 1-1) පුරප්පාඩු - 01

**බාහිර අයදුම්කරුවන්**

**මූලික සුදුසුකම්**

ක්‍රීඩා / ක්‍රීඩා කළමනාකරණය / අවස්ථා කළමනාකරණය / රාජ්‍ය පරිපාලන විෂයයන් එකක් හෝ කිහිපයක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධිය

**සහ**

අවම වශයෙන් අවු 03 ක සේවා පළපුරුද්ද තිබීම හෝ පිළිගත් ක්‍රීඩා ඩිප්ලෝමාවක් ලබා තිබීම

**සහ**

අවු 05ක සේවා පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 01 හෝ 02 හෝ 03)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන (MA - 1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.
3. තාක්ෂණික ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සම්බන්ධයෙන් වන විට, කළමනාකරණ සහකාර – තාක්ෂණික (MA - 2) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**වැටුප් පරිමාණය හා කාණ්ඩය** : (2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)
JM 1-1 – 2025 - (72,650 - 10 x 1,360 - 18 x 2,040 - 122,970)

**වයස් සීමාව** : අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප** : කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 01/2025 හි විධිවිධානයන්ට අනුව , ඉහත වැටුප් පරිමාණයන්ට ඇති හිමිකම පත්වීම් දින සිට ක්‍රියාත්මක වේ. අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වන වැටුප් වැඩිවීමට අනුකූලව ,අදාළ පත්වීම් වර්ෂය සඳහා එම තනතුරට නියමිත වැටුප සමඟ රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය:**

ඉහළම සුදුසුකම් සහ ක්ෂේත්‍රයේ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර , සම්මුඛ පරීක්ෂණයෙහි කාර්යය සාධනය මත තෝරාගනු ලැබේ.

**පත්කිරීමේ ස්වභාවය:**

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් සහිත පත්වීමකි.

**බඳවා ගැනීමේ ක්‍රම වේදය:**

මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරාලන සහ පත්කිරීම් බලධාරියා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සුදුසුකම් ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකින් උපරිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අදාළ තනතුරු සඳහා බඳවා ගැනීමට තෝරාගනු ලැබේ. මෙම සුදුසුකම් ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටිය අනුව ලකුණු ලබාදීමේ ක්‍රමවේදයට අනුකූලව පවත්වනු ලැබේ.

**පොදු අවශ්‍යතා සහ කොන්දේසි**

ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වියයුතුය.

දැනට රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් හරහා අයදුම්පත් යොමු කළයුතු වේ.

තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා යෝග්‍ය කායික හා මානසික තත්වයක් තිබිය යුතුය.

විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

ඉල්ලුම් කරන තනතුර අයදුම්පත බහාලූ ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළයුතුය.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන අයදුම්කරුවන් අයදුම්පත්‍රය හා සියලුම අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් තමා විසින්ම සහතික කර 2026.05.06 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය. අදාළ අයදුම්පත්‍රයේ ආකෘතිය සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ නිල වෙබ් අඩවිය වන **https://snsca.gov.lk** වෙතින් බාගත කර ගත හැක. අවසන් දිනෙන් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,**
**තැ පෙ 2211, ආතර් ද සිල්වා මාවත, කොළඹ 13.**
**දුරකථන අංක : 011 2445677 / 011 2384385**